# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## විද්‍යාවේදී කෘෂිවිද්‍යා හා කළමනාකරණ උපාධි පාඨමාලාව සඳහා විශේෂ ප්‍රවේශය යටතේ සිසු / සිසුවියන් බඳවා ගැනීම 2020 / 2021 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨය මගින් පවත්වනු ලබන විද්‍යාවේදී කෘෂි විද්‍යා හා කළමනාකරණ උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා රාජ්‍ය හා පිළිගත් පෞද්ගලික අංශයේ කෘෂිකාර්මික සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, කෘෂි විද්‍යා පීඨය, බෙලිහුල්ඔය මගින් පවත්වනු ලබන සිව් අවුරුදු කෘෂි විද්‍යා හා කළමනාකරණ (විශේෂ) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ගනු ලැබේ.

**සුදුසුකම්**

01. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය සනාතන සභාව මගින් පිළිගනු ලබන පිළිගත් තෘතීය අධ්‍යයන ආයතනයක් මගින් පවත්වනු ලැබූ දෙඅවුරුදු හෝ තුන් අවුරුදු කෘෂි විද්‍යා / සත්ව පාලනය / කෘෂි ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධ උසස් ඩිප්ලෝමාවක් (NVQ - Level 4) හදාරා තිබීම සහ

02. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය සනාතන සභාව මගින් පිළිගනු ලබන කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ පිළිගත් රජයේ / පෞද්ගලික ආයතනයක* වසර 5 ක රැකියා පළපුරුද්ද සහ

03. වයස අවුරුදු 40 ට අඩුවීම සහ

04. විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තරග විභාගයකින් සමත්වීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා සාර්ථකව මුහුණ දීම (තරග විභාගය හා සම්මුඛ පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ)

⋆පෞද්ගලික ආයතනයක් යනු සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සමාගමක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි වූ සමාගමක් හෝ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් ව්‍යවසායකයන් වේ.

අයදුම්කරුවන් රැකියා පළපුරුද්ද තම සේවා යෝජකයා ලවා සහතික කර ඉදිරිපත් කළ යුතුය.

උපාධි පාඨමාලාව සඳහා සීමිත අයදුම්කරුවන් පිරිසක් බඳවා ගනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය සේවා, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය යන ලිපිනයට, තම නම හා ලිපිනය සඳහන් මුද්දර කවරයක් (9" x 4") යොමු කිරීම මගින් අයදුම්පත් ලබාගත හැකිය. www.sab.ac.lk / notices යන වෙබ් අඩවිය මගින්ද අයදුම්පත බාගත කර ගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැල මගින් ඉහත දක්වා ඇති ලිපිනයට 2022 ජූනි මස 13 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.**